# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1983/30 - 2016 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2016.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම උපලේඛනයේ I සහ II හි I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයන් හැර එම ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශ එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 අගෝස්තු මස 24 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 සහ 18 වන මහල්,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

උපලේඛනය 1

*ගම්පහ දිස්ත්‍රික්කය*

*I වන තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කළ අංක 1172/7 හා 2001.02.20 දින දරන ගම්පහ මහ නගර සභා බල ප්‍රදේශය ද, අංක 1000/3 හා 1997.11.03 දින දරන මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය ද, අංක 153/13 හා 1981.08.14 දින දරන ජාඇල නගර සභා බල ප්‍රදේශය ද, අංක 1232/15 හා 2002.04.19 දින දරන වත්තල-මාබෝල නගර සභා බල ප්‍රදේශය ද, අංක 1172/7 හා 2001.02.20 දින දරන සීදුව-

*II වන තීරුව*

උතුරට :

වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිමත් මාඔයෙහි උතුරු ඉවුරත් ඡේදනය වන ලක්ෂ්‍යයෙන් පටන් ගෙන වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර, උතුර, වයඹ, නැගෙනහිර, ගිණිකොන, නැගෙනහිර හා ඊසාන දෙසට ගමන් කොට දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර හා දකුණු මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය 1** *(සම්බන්ධිතයි)*

*I වන තීරුව*

කටුනායක නගර සභා බල ප්‍රදේශය ද, අංක 100/4 හා 1980.08.04 දින දරන මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ද, 154/13 හා 1980.08.14 දින දරන පෑලියගොඩ නගර සභා බල ප්‍රදේශය ද, අංක 1172/7 හා 2001.02.20 දින දරන කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද, අංක 1771/10 හා 2000.02.13 දින දරන කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද, අංක 1771/10 හා 2001.02.13 දින දරන බියගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද, අංක 376/40 හා 1985.11.19 දින දරන රාගම නාගරික බල ප්‍රදේශය ද, අංක 827/14 හා 1994.07.14 දින දරන දඩුගම්පේරුව නාගරික බල ප්‍රදේශය ද, අංක 1171/10 හා 2001.02.13 දින දරන අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් ද, අංක 1225/30 හා 2002.03.01 දින දරන මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් ද, අංක 885/6 හා 1995.08.22 දින දරන වත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් ද, අංක 788/10 හා 1993.10.14 දින කරන දිවුලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් ද, අංක 807/4 හා 1994.02.21 දින දරන මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් ද, අංක 223/16 හා 1982.12.17 දින දරන වෙරළ කලාපීය බල ප්‍රදේශය ද, මෙයට අමතරව බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් වන්නා වූ මෙහි II වැනි තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය ද වේ.

*II වන තීරුව*

දක්වා ද, එතැන්සිට දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නැගෙනහිර, දකුණ, උතුර, නැගෙනහිර, දකුණ, නැගෙනහිර, උතුර, නිරිත, ඊසාන, උතුර, නැගෙනහිර, නිරිත, දකුණ, නැගෙනහිර, වයඹ, ගිණිකොන, නැගෙනහිර, උතුර හා නැගෙනහිර දෙසට ගමන් කර, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර හා දකුණු මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම් ඔස්සේ ගිණිකොන, උතුර, නැගෙනහිර, ඊසාන, වයඹ, උතුර, නැගෙනහිර, උතුර, ගිණිකොන, නැගෙනහිර, ඊසාන, නැගෙනහිර, උතුර, බටහිර උතුර, ඊසාන, නැගෙනහිර, උතුර, දකුණ, නැගෙනහිර, දකුණ, නැගෙනහිර, නිරිත, ගිණිකොන, නැගෙනහිර, ගිණිකොන, දකුණ හා ඊසාන දෙසට ගමන් කර නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද වේ.

**නැගෙනහිර :**

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම් ඔස්සේ ගිණිකොන දෙසට ගමන්කර අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම් ඔස්සේ නිරිත, ගිණිකොන, දකුණ, ඊසාන හා ගිණිකොන දෙසට ගමන්කර වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු හා බටහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම් ඔස්සේ දකුණ, ගිණිකොන, දකුණ, නිරිත, දකුණ, ගිණිකොන, නිරිත, දකුණ, නිරිත, දකුණ, වයඹ, බටහිර, ගිණිකොන, දකුණ, නිරිත හා බටහිර දෙසට ගමන්කර රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ගිණිකොන, නිරිත, දකුණ, බටහිර, දකුණ, නිරිත, දකුණ, නැගෙනහිර හා දකුණු දෙසට ගමන් කර හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද වේ.

**දකුණ :**

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම් ඔස්සේ බටහිර, දකුණ, බටහිර, දකුණ, බටහිර, නිරිත, දකුණ, බටහිර, වයඹ, නිරිත, බටහිර, උතුර හා වයඹ දෙසට ගමන්කර හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර, උතුර හා වයඹ දෙසට ගමන්කර කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු හා බටහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නිරිත, බටහිර, නිරිත, වයඹ, බටහිර, නිරිත දෙසට ගමන් කර කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු සහ

**උපලේඛනය** 1 (සම්බන්ධිතයි)

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| | නැගෙනහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර, උතුර, වයඹ, නිරිත, වයඹ, නිරිත, බටහිර, වයඹ, බටහිර, උතුර, ඊසාන, බටහිර හා උතුරු දෙසට ගමන්කර කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර හා උතුරු මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ උතුරු, ඊසාන, උතුරු, බටහිර දෙසට ඉන්දියන් සාගරයේ ඉහල වඩදිය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද වේ.<br><br>**බටහිර :**<br><br>අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඉන්දියන් සාගරයේ වඩදිය රේඛාව ඔස්සේ උතුරු, බටහිර, උතුරු දෙසට ගමන්කර ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ. |

09-906

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.